YOUNG JOURNALISTS' Association

2022/10/23

**අමාත්‍ය විජයදාස රාජපක්ෂ,**
අධිකරණ අමාත්‍යංශය,
නො.19,
ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

මහත්මයාණෙනි,

**<u>ජනමාධ්‍යවේදීන්ට එරෙහිව කරනු ලැබූ ප්‍රකාශය සම්බන්ධයෙනි</u>**

'ද මෝර්නිං' පුවත්පතේ 2022 ඔක්තෝබර 20 වැනිදා පළ වූ ප්‍රවෘත්තියක් සම්බන්ධයෙන් ඔබ විසින් 2022 ඔක්තෝබර 21 වැනිදා පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශය සත්‍ය සඟවමින් කරන ලද ප්‍රකාශයක් සේ සලකමින් එම ප්‍රකාශය දැඩි ලෙස හෙළා දකින බව තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය ලෙස දැනුම් දෙනු කැමැත්තෙමු.

එම පුවත්පතෙහි '*Wijeyadasa's chamber appearing for Thilini questioned in court - Opposing Counsel claims conflict of interest*' හිසින් පළවූ පුවත අධිකරණ වාර්තාවක් වන අතර එහි අධිකරණයේදී සිදුවූ සිදුවීම්වලට පිට දෙයක් හෝ ජනමාධ්‍යවේදියාගේ මතයක් සඳහන් වන්නේ නැත. **(ඇමුණුම 01)** ඔබ පාර්ලිමේන්තුවේදී මෙම ප්‍රවෘත්තියේ ශීර්ෂය ලෙස සඳහන් කළ පළමු කොටස වන '*Wijeyadasa's chamber appearing for Thilini questioned in court*' එම පුවත්පතේ ශීර්ෂයේ තිබුණ ද එහි ඔබ කියැවූ දෙවැනි කොටස වන 'conflict of interests, either resign from Ministry or withdrawal from the case ' එම පුවත්පතේ ශීර්ෂයේ නැත. පාර්ලිමේන්තුව පමණක් නොව පුරවැසියාද නොමග යවන අයුරින් ඔබ එම පුවත්පතේ ශීර්ෂයේ නැති කොටසක්, එහි ඇති බව හඟවමින් ව්‍යාජ ප්‍රකාශයක් කිරීම සම්බන්ධයෙන් අපි විමතියට පත්වූ අතර එහි අරමුණම ජනමාධ්‍ය ක්ෂේත්‍රය කෙරෙහි ජනතාව තුල යම් සැකයක් හෝ විරෝධයක් ඇති කිරීම බව අපගේ විශ්වාසයයි.

Address - 176/3, Oruthota,Gampaha.
Email - web.yjasl@gmail.com
Tel - 071 0 66 14 17
077 0 65 82 85

එම පුවත්පතේ අදාල ප්‍රවෘත්තියේ පැහැදිලිවම සඳහන් කර ඇත්තේ ඔබගේ චේම්බරයේ නීතිඥයන් පෙනී සිටින බව අධිකරණයේදී ප්‍රකාශ කළේ ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න බවයි. එම කොටස ජනමාධ්‍යවේදීන් අතින් දැමා සැකසූ ව්‍යාජ ප්‍රවෘත්තියක් නොවේ. එම අවස්ථාවේ අධිකරණයේ සිටි සෙසු මාධ්‍යවේදීන්ගෙන් සහ නීතිඥවරුන්ගෙන් අප ඒ ගැන විමසූ අවස්ථාවේදී ඔවුන් ද ඒ බව තහවුරු කළේය. එසේම එම පුවත කෙතරම් සමබර පුවතක්ද යත් සැකකාරිය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන්ගේ කරුණු දැක්වීම් පවා එහි අන්තර්ගත විය. ද මෝර්නිං පුවත්පත පමණක් නොව මව්බිම පුවත්පත ද මෛත්‍රී ගුණරත්න නීතිඥවරයා අධිකරණයේ දී කළ ප්‍රකාශය ප්‍රධාන සිරස්තලයේ අනු සිරස්තලයක් ලෙස වාර්තා කර තිබිණි. **(ඇමුණුම 02)**

ඔබේ චේම්බරයේ නීතිඥයන් පෙනී නොසිටියේ නම් හෝ ඔබට දැන් චේම්බරයක් නැතිනම් ඔබ කළ යුතුව තිබුණේ අධිකරණ ක්‍රියාවලිය වාර්තා කළ ජනමාධ්‍යවේදීන්ට සහ ජනමාධ්‍ය ආයතනවලට දොස් නැගීම නොව, අදාල ප්‍රකාශය කළ ජනාධිපති නීතිඥවරයාට දොස් නැගීමයි.

අනෙක් අතට ජනාධිපති නීතිඥවරයා ඒ බව කිව්වද නොකිව්වද, ඔබේ චේම්බරයේ නීතිඥයන් සැකකාර කාන්තාව වෙනුවෙන් පෙනී සිටියේ නම් එලෙස පෙනී සිටීමට නීතිඥයන්යට අයිතියක් ඇතිවා සේම ඒ බව වාර්තා කිරීමට ජනමාධ්‍යවේදීන්ට ද අයිතියක් ඇත. විශේෂයෙන් ඔබ මේ රටේ අධිකරණ අමාත්‍යවරයා ලෙස හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ඔබට යම් වරප්‍රසාදයක් ඇත්නම් එය ලැබෙන්නේ ඔබට අවශ්‍ය ආකාරයට ජනමාධ්‍යට චෝදනා නැගීමට නොව, වගකීම් සහගත හැසිරීමකින් ජනතාවට සේවය කිරීමට පමණි.

එසේ තිබියදී අදාල සැකකාර කාන්තාව වෙනුවෙන් පෙනී සිටි ඔබේ පුත්‍රයා කෙසේ වෙතත් **නීතිඥ දසුන් නාගස්හේන** ඔබගේ අමාත්‍යංශයේ ඔබගේ කාර්යාලයේ **සම්බන්ධීකරණ ලේකම්** නොවේදැයි ඔබ රටට පැහැදිලි කළ යුතුය. අධිකරණ අමාත්‍යංශයේ නිල වෙබ් අඩවියේ අධිකරණ අමාත්‍යවරයාගේ කාර්යාලයේ සම්බන්ධීකරණ විස්තර පිටුවේ දසුන් නාගස්හේන නම් පුද්ගලයකුගේ නමක් ඇති අතර ඔහුගේ තනතුර ලෙස සඳහන් කර ඇත්තේ සම්බන්ධීකරණ ලේකම් ලෙසයි. **(ඇමුණුම 03)** දසුන් නාගස්හේන නම් නීතිඥවරයකු සැකකාර තිළිණි නම් කාන්තාව වෙනුවෙන් පෙනී සිටි බව මෝර්නිං පුවත්පත පමණක් නොව වෙනත් පුවත්පත් සහ මාධ්‍යය ද වාර්තා කර තිබිණි. **(ඇමුණුම 04)**

එසේ තිබියදී එම නීතිඥවරයා ඔබගේ සම්බන්ධීකරණ ලේකම් හෝ නිලධාරියෙක් නොවේද යන්න ගැන පැහැදිලි කිරීමක් කරනවා වෙනුවට ජනමාධ්‍යවෙත චෝදනා කිරීම බරපතල තත්ත්වයකි. ජනමාධ්‍යවේදීන්ට වසර දෙකක් දක්වා සිර දඬුවම් දිය හැකි බව කියමින් ඔබ මෙම සිදුවීම ගැන කතා කරන්නේ පැහැදිලිවම සත්භාවයෙන් නොව, ජනමාධ්‍යවේදීන් බිය ගැන්වීමේ අදහසින් බවට අපි විශ්වාස කරමු.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඇති බලතල හා වරප්‍රසාද පෙන්වමින් ජනමාධ්‍ය සමාජය බිය ගැන්වීමට උත්සාහ කිරීම බලය අයුතු ලෙස භාවිතා කිරීමක් ලෙස අපි සලකමු.

පුරවැසියන්ගේ ඡන්දයෙන් තේරී පත්වූ මන්ත්‍රීවරයකු සහ පුරවැසියන්ගේ මුදලින් වැටුප් හෝ දීමනා ලබන අමාත්‍යවරයකු ලෙස ඔබ කළ යුත්තේ සත්‍ය අනාවරණය කරන ජනමාධ්‍ය ආරක්ෂා කිරීම මිස ඔවුන් කම්ටුවලට කැඳවා භාෂණයේ ප්‍රකාශනයේ නිදහස හීන කිරීම හෝ තොරතුරු දැන ගැනීමේ අයිතිය හීන කිරීම නොවේ.

ජනමාධ්‍ය වෙත ව්‍යාජ චෝදනා නගමින් ඔබ කළ ප්‍රකාශයට තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය ලෙස දැඩි විරෝධය පළ කරනා අතරතුරම ජනමාධ්‍යවේදීන් කිමිටුවලට කැඳවීමට හැකියාව ඇති අදාල මන්ත්‍රී වරප්‍රසාද අහෝසි කරීමට පියවර ගන්නා ලෙස ද බල කර සිටිමු.

ස්තුතියි.
මෙයට,
විශ්වාසී

**තරිඳු ජයවර්ධන**
සභාපති

**එම් එෆ් එම් ෆසීර්**
ලේකම්

**<u>පිටපත්</u>**

1) කතානායක, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.
2) සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්.
3) මහලේකම්, අන්තර් පාර්ලිමේන්තු සංගමය.
4) ජනමාධ්‍ය.

Address - 176/3, Oruthota,Gampaha.
Email - web.yjasl@gmail.com
Tel - 071 0 66 14 17
077 0 65 82 85

**ඇමුණුම -01**

# Wijeyadasa's chamber appearing for Thilini questioned in court

- *Opposing Counsel claims conflict of interest*

BY BUDDHIKA SAMARAWEERA



Justice Minister Dr. Wijeyadasa Rajapakshe PC

President's Counsel (PC) Maithri Gunaratne yesterday (19) raised concerns regarding the presence of a group of lawyers, including Attorney-at-Law Rakhitha Rajapakshe, who is the son of Minister of Justice, Prisons Affairs, and Constitutional Reforms Dr. Wijeyadasa Rajapakshe PC, appearing on behalf of the suspect in the case of suspected fraudster Thilini Priyamali, who is accused of large-scale...

***Contd. on page 2***

**ඇමුණුම -02**



# ඇප ගන්න කෝටි 3ක් ඉල්ලා ප්‍රියමාලිගෙන් එළියට ඇමතුමක්

2 පිටුවට

හංසි නානායක්කාර

හඬපටවලින් එළිවූ දේශපාලකයන්, ප්‍රභූන් තාම පැමිණිල්ලක්වත් නොදැමීම ගැටලුවක්

බන්ධනාගාරය ඇතුළේ ඉඳන් ෆෝන් තුනකින් එකොළොස්දෙනකුට කෝල් කරලා

CIDය අධිකරණයේදී හෙළි කරයි

ජානකී සිරිවර්ධන අත්අඩංගුවට නොගන්නේ ඇයි?

තිළිණි වෙනුවෙන් කතා කරන්න අධිකරණ ඇමැතිගේ නීතිඥ මණ්ඩලයම උසාවි ඇවිත්

- මෛත්‍රී ගුණරත්න

Address - 176/3, Oruthota,Campaha.

Email - web.yjasl@gmail.com

Tel - 071 0 66 14 17

077 0 65 82 85

**ඇමුණුම -03**

Ministry of Justice, Prison Affairs and Constitutional Reforms

Home About Us Services

Office of the Minister of Justice

| Name & Designation | Telephone | Fax | Ext | E-mail |
|---|---|---|---|---|
| Hon. Wijeyadasa Rajapakshe *Minister of Justice* | | +94 112 445 446 | 101 | minister@moj.gov.lk |
| Mr. S.Gamage *Private Secretary* | +94 112 433 192 | +94 112 435 294 | 102 | gamage.c@moj.gov.lk |
| Mr. S.D.Udawaththa *Public Relations Officer* | +94 112 431 846 | | 104 | |
| Mr. Dasun Nagashena *Coordinating Secretary* | +94 112 470 823 | | 106 | |

YOUNG JOURNALISTS' Association

**ඇමුණුම -04**

(2022 ඔක්තෝබර 20 සිලෝන් ටුඩේ පුවත්පතේ දෙවැනි පිටුවේන්.)

He insisted that if the intermediary party had been arrested, the CID would be able to figure out, as to what had become of the monies that had been defrauded by the suspect.

A group of lawyers, headed by Counsel Dasun Nagashena looked into the interests of the suspect. They maintained that those who had deposited money with their client had been highly esteemed people in society and from various walks of life.

They also said it would be timely if the prosecution could also inquire, as to whether the businessmen and politicians, who had depositrd such sizeable amounts of cash, had paid taxes to date.

They also said the prosecution had deceived Court stating that they had seized three cell phones from their client's possession within her prison cell, when in reality they had only seized a single cell phone.

Address - 176/3, Oruthota,Gampaha.
Email - web.yjasl@gmail.com
Tel - 071 0 66 14 17
077 0 65 82 85

(2022 ඔක්තෝබර 20  මව්බිම පුවත්පතේ දෙවැනි පිටුවේන්.)

ගැනීමට හැකියාවක් ඇති බවට අධිකරණය හමුවේ දැනුම් දී සිටියේය.

ඉන් අනතුරුව සැකකාරිය වෙනුවෙන් නීතිඥ දසුන් නාගස්හේන, නීතිඥ රකිත රාජපක්ෂ, නීතිඥ සෞම්‍ය හෙට්ටිආරච්චි හා නීතිඥ ඉන්දික ප්‍රේමතිලක යන මහත්වරු අධිකරණය හමුවේ පෙනී සිටියහ.

එම අවස්ථාවේදී නැඟී සිටි අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න මහතා සඳහන් කර සිටියේ තිළිණි වෙනුවෙන් කරුණු දැක්වීම සඳහා අධිකරණ ඇමැතිතුමාගේ නීතිඥ මණ්ඩලයම අද අධිකරණය හමුවේ පෙනී සිටින බවය.

තම සේවාදායිකාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහන් කරන තරම් විශාල වංචාවක් සිදුකර නොමැති බවත් පොලිසිය විසින් ඔවුන්ගේ හිතු මනාපෙට අධිකරණය හමුවේ කරුණු දක්වන බවත් සැකකාරිය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් අධිකරණය හමුවේ ප්‍රකාශ කර සිටියහ.

එසේම මම සේවා දායිකාව 2 මුදල් තැන්පත් කර ඇත්තේ රටේ සුප්‍රකට ව්‍යාපාරිකයන් වන බවත් මේ අනුව එතරම් විශාල මුදල් ප්‍රමාණයක් එම ව්‍යාපාරිකයන් විසින් මෙලෙස තැන්පත් කිරීමට තරම් එම මුදල් ඔවුන් විසින් උපයා ගනු ලැබුවේ කෙසේදැයි සොයා බැලීමද වැදගත් වන බව සැකකාරිය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් අධිකරණය හමුවේ ප්‍රකාශ කළේය.

එමෙන්ම මේ තරම් විශාල මුදල් ප්‍රමාණයක් එම ව්‍යාපාරිකයන් විසින් උපයා ගනු ලැබූ අයුරු මෙන්ම ඔවුන් මේ වනවිට එම මුදල් සඳහා ආදායම් බදු නිසිලෙස ගෙවා ඇද්දැයිද විමර්ශනය කළ යුතු බවත් සැකකාරිය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා අධිකරණය හමුවේ ප්‍රකාශ කළේය.

එමෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සැකකාරිය සන්තකයේ බන්ධනාගාරය තුළ තිබියදී දුරකථන තුනක් සොයාගනු ලැබුවා යැයි කීවද චෝදනා ගොනු කර ඇත්තේ එක් දුරකථනයක් ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් වන බව ප්‍රකාශ කළ නීතිඥවරයා තම සේවාදායිකාව වෙත ගොනු කර ඇති චෝදනා සියල්ලම ඇප ලබාදිය හැකි චෝදනා බව අධිකරණය හමුවේ ප්‍රකාශ කළේය.